**IPRC/16/265**

# උත්තර භාරතීය හින්දු ජන සමාජයේ සහ ලාංකේය බෞද්ධ ජන සමාජයේ පවතින ගෘහස්ථ චාරිත්‍ර පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

කාංචනා ද අල්විස්[1*]

ලොව පවතින සෑම ජන සමාජයක් තුළ ම එම සමාජයට අනන්‍ය වූ ගෘහස්ථ චාරිත්‍ර විධි සමුදායක් දක්නට ලැබේ. ජන ජීවිතයේ විවිධ අවස්ථා හා සම්බන්ධ වන මෙම ගෘහස්ථ චාරිත්‍ර විධි මගින් එම සමාජ පිළිබඳ තොරතුරු හෙළි කෙරේ. මිනිස් ජීවිතයේ විවිධ අවස්ථා හා විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ මෙම ගෘහස්ථ චාරිත්‍ර විධි බිහි වී ඇත. උත්තර භාරතීය හින්දු ජන සමාජය තුළ ඈත අතීතයේ පටන් ගෘහස්ථ චාරිත්‍ර විධි පැවත ආ අතර නූතනය වන විට එම චාරිත්‍ර විධි දහසයක් ප්‍රධාන වශයෙන් භාවිත වේ. දරුවකු පිළිසිඳ ගැනීමේ පටන් මරණය දක්වා ජීවිතයේ විවිධ අවස්ථාවන්හි දී මෙම ගෘහස්ථ චාරිත්‍ර විධි ජන සමාජය තුළ භාවිත වේ. ලාංකේය ජන සමාජය තුළ ද දරුවකු පිළිසිඳ ගැනීම, රංකිරි කට ගෑම, නම් තැබීම, ඉඳුල් කට ගෑම, කන් විදීම ආදි කොට ගෙන ගෘහස්ථ චාරිත්‍ර විධි දක්නට ලැබේ. මෙම අධ්‍යයනය මගින් උත්තර භාරතීය හින්දු ජන සමාජය සහ ලාංකේය බෞද්ධ ජන සමාජයෙහි ගෘහස්ථ චාරිත්‍ර විධි අතර පවතින සාම්‍යත්වය සහ විවිධත්වය පිළිබඳ ව අධ්‍යයනය කෙරේ. එක ම ජීවන අවධියක ජන සමාජයෙන් ජන සමාජයට වෙනස් වූ ද සමාන වූ ද ගෘහස්ථ චාරිත්‍ර විධි මෙහි දී දක්නට ලැබේ. මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍යයික විමර්ශනයක් ප්‍රමුඛ කොට ගත් තුලනාත්මක විග්‍රහයක් පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් උපයෝගී කර ගැනෙයි.

***ප්‍රමුඛ පද :*** *ගෘහස්ථ චාරිත්‍ර, සාම්‍යත්වය, විවිධත්වය, බෞද්ධ, හින්දු*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *ksalwis@gmail.com